# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1956/18 - 2016 මාර්තු මස 02 වැනි බදාදා - 2016.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2011.

**1963 අංක 11 දරන මුදල් පනත**

72 වන වගන්තිය යටතේ වූ නියමය

1963 අංක 11 දරන මුදල් පනතේ 71 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 72 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ වර්ෂ දෙදහස් දහසයක් වූ මාර්තු මස 02 වන දින සිට බලාත්මක වන පරිදි, 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව වෙත මේ නියමය මගින් පවරා දෙමි.

රවී කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 මාර්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

01. උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ කෝපායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිරුප්පිඩ්ඩි නැගෙනහිර අංක J/271 ග්‍රාම නිලධාරි වසමේ වලිකාමම් නැගෙනහිර කොට්ඨාසයේ පුත්තූර් මීසමට අයත් සිරිප්පිඩ්ඩි හී පිහිටි ''තම්පනෙයි'' නම් ඉඩමට මායිම් නැගෙනහිරට මුත්තතම්බි අරුණාචලම් සහ අනෙකුත් අයට අයිති ඉඩම ද, උතුරට මියගිය මලවරයාර් කන්දයියා සහ අනෙකුත් අයගේ උරුමක්කරුවන්ට අයත් ඉඩම ද, බස්නාහිරට කන්දයියා අරුණාචලම් සහ අනෙකුත් අයට අයත් ඉඩම ද දකුණට සින්නතම්බි කන්දයියා සහ වෙනත් අයට අයත් ඉඩම ද යන මායිම් තුළ පිහිටි ලාචම් තිහක් විශාල ඉඩම සහ ඊට අයත් සෑම සියළු දේ ද වේ.

මෙම ඉඩම යාපනය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 136/207 යටතේ ලියාපදිංචි වී ඇත.

02. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ උඩුගහ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරිවත්තුඩුව උතුරු (අංක 603) ග්‍රාම නිලධාරි වසමේ කිරිවත්තුඩුව ගමේ පිහිටි අළුබෝගහ වත්ත නම් ඉඩමේ ඊ අක්ෂරය දරන කොටසට බලයලත් මිනින්දෝරු පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර මහතා විසින් මැන සාදන ලද 2006.04.19 දින සහ අංක 5869 දරන ප්ලෑනේ ප්‍රකාර බෙදා වෙන්කළ ලොට් 1/ඒ දරන කොටස් වූ උතුරට යූ. පී. අමරදාසට අයිති මිල්ලගහවත්ත ද, නැගෙනහිරට කල්පගේ සේදිරිස්ට සහ තවත් අයට අයිති අලුබෝගහ වත්ත ද, දකුණට එකී සිතියමේ ලොට් 1/එෆ් සහ 1/බී දරන කොටස් ද බස්නාහිරට එස්. ඩී. ධර්මදාස සහ තවත් අයට අයිති අලුබෝගහ වත්ත ද මායිම් වන පර්චස් දහයක් (අ. 00, රූ. 00, පර්. 10) හෙවත් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි දෙකයි පහයි තුනයි (හෙක්ටයාර 0.0253) විශාල ඉඩම සහ එයට අයත් ගහකොළ පලතුරු යනා දී සියළු දේ ද.

ඉහත කී කිරිවත්තුඩුවේ පිහිටි අලුබෝගහ වත්ත නම් ඉඩමේ එකී අංක 5869 දරන සිතියම අනුව බෙදා වෙන් කළ ලොට් 1/එෆ් දරන කොටස වන උතුරට ලොට් 1/ඒ සහ ලොට් 1/බී ද අංක 1245 දරන සිතියමේ ලොට් 02 දරන කොටසේ ඉතිරිය ද නැගෙනහිරට කල්පගේ සේදිරිස්ට සහ තවත් අයට අයිති අලුබෝගහ වත්ත ද, දකුණට ලොට් 1/සී දරන කොටස ද, බස්නාහිරට ලොට් 1/බී දරන කොටස ද මායිම් වන පර්චස් දහයයි දශම නවයයි බිංදුව (අ. 00, රූ. 00, පර්. 10.90) ක් විශාල අඩි 12 ක් පළල පාරේ පොදු මාර්ග අයිතිය ද සමග වේ.

මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 104/93 පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

03 - 488/1

---

එල්.ඩී.බී. 9/2011.

**1963 අංක 11 දරන මුදල් පනත**

72 වන වගන්තිය යටතේ වූ නියමය

1963 අංක 11 දරන මුදල් පනතේ 71 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 72 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ වර්ෂ දෙදහස් දහසයක් වූ මාර්තු මස 02 වන දින සිට බලාත්මක වන පරිදි, 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව වෙත මේ නියමය මගින් පවරා දෙමි.

රවී කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 මාර්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පල හත්පත්තුවේ යගම්පත්තු කෝරලේ කහදෙණිගම පිහිටි වටවලගාවවත්ත සහ වටවලගාවවත්ත කියන ඉඩමට 2001.09.30 දින එච්. ඒ. එම්. සී. බණ්ඩාර මිනින්දෝරු තැන සාදන ලද අංක 3085 දරන බෙදුම් පිඹුරේ ලොට් 04 ට මායිම් ; උතුරට මෙම ඉඩමෙන් ඔයට බෙදා වෙන් කළ බිම් තීරය ද, නැගෙනහිරට එකී ප්ලෑනයේ ලොට් 05 දරන කොටස ද, දකුණට එකී ප්ලෑනයේ ලොට් 06 දරන පාරක් සඳහා වෙන්කළ බිම් තීරය ද, බස්නාහිරට එකී ප්ලෑනයේ ලොට් 03 දරන කොටස ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකකුත් පර්චස් විසි හතරයි දශම අටයි පහක් (අෘ 00, රූෘ 01, පෘ 24.85) ක් විශාල ඉඩම සහ ඊට අයත් සෑම සියළු දේ ද වේ.

තවද ඉහත කී අංක 3085 දරන පිඹුරේ ලොට් 06 දරන කොටසට මායිම් ; උතුරට ඉහත කී පිඹුරේ ලොට් 03 සහ 04 ද, නැගෙනහිරට එකී පිඹුරේ ලොට් 05 ද, දකුණට ගිරිගෝරිස් සහ තව අයගේ උරුමක්කාරයන් හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට කප්පන්ගමුව - උඩුබද්දාව ප්‍රධාන මාර්ගය ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම හයක් (අෘ 00, රූෘ 00, පෘ 12.06) විශාල බිම් තීරය පාරක් වශයෙන් පාවිච්චි කිරීමේ, නඩත්තු කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ අයිතියත් සමග වේ.

මෙම ඉඩම කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ R 72/74 සහ R 72/76 යටතේ ලියාපදිංචි වී ඇත.

03 - 488/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.